# ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පොත් අගය ශුන්‍ය වී තිබුණු මෝටර් රථ, යන්ත්‍රෝපකරණ වැනි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නැවත ගිණුම්වලට ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ආ) 1999 අගෝස්තු 30 දිනැති ප්‍රධාන තක්සේරුකරුගේ ලිපිය පරිදි තේ කම්හලක් සහිත ඉඩමක් තක්සේරු වටිනාකම රු.1,500,000 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රකාශන වල එම ඉඩමේ වටිනාකම රු.1,400,000 කින් අඩුවෙන් රු. 100,000 ක් ලෙස දක්වා තිබුණි. වත්දී තක්සේරු වටිනාකමද ලබාගෙන නොතිබුණි.

(ඇ) අධිකාරියට අයත් ඉඩමකින් අක්කර 02 ක බිම් කොටසක් බූගන් ෆාම් ව්‍යාපෘතිය සඳහා 2009 අගෝස්තු 20 දිනැති බදු ගිවිසුමෙන් බාහිර පුද්ගලයෙකුට පවරා දී තිබුණි. ආංශික කළමනාකරු (ඉඩම්) ගේ 2008 දෙසැම්බර් 08 දිනැති ලිපියකින් බූගන් ෆාම් වගාව සඳහා වෙන්කළ පර්චස් 300 ක බිම් ප්‍රමාණයේ වටිනාකම ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව රු.1,800,000 ක් ලෙස සඳහන් කර තිබුණි. එහෙත් මූල්‍ය ප්‍රකාශන වල ඉඩම අත්පත් කර ගැනීමට වැය කරන ලද රු.250,000 ක් පමණක් දක්වා තිබූ හෙයින් රු. 1,550,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශන වල උපචිත වියදම් යටතේ දිවි නැගුම වෙත ගෙවිය යුතු ලෙස රු.6,959,614 ක් දක්වා තිබුණද එදිනට ප්‍රගති වාර්තාව අනුව එම ගෙවිය යුතු වියදම රු.5,015,174 ක් වූයෙන් රු.1,944,440 ක වෙනසක් විය.

### 1.2.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතන හා පුද්ගලයින් 8 දෙනෙකුගෙන් වර්ෂ 2 සිට වර්ෂ 13 දක්වා වූ කාල පරිච්ඡේදයන් තුල ලැබිය යුතුව තිබුණු රු.221,183 ක මුදලක් ඉදිරියට ගෙන එමින් පැවතියද එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් වසර 13 කට පෙර ආයතනයකට ලබාදී තිබූ රු.1,258,554 ක ණය මුදලක් සහ තවත් ආයතන 06 ක් වෙත වසර 12 කට පෙර ලබාදී තිබුණ රු.134,656 ක ණය සහ අත්තිකාරම් මුදලක් ආපසු අයකර ගැනීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) විවිධ ව්‍යාපෘති සහ විවිධ ආයතන හා පුද්ගලයන් වෙත වර්ෂ 12 කට පමණ පෙර ගෙවා තිබ රු.1,301,601 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දින වනවිටද ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 විගණනය සදහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල සදහන් රු.2,252,039 ක් වටිනා ගෙවිය යුතු ශේෂ 16 ක් සදහා ශේෂ සනාථ කිරීමේ ලිපි ලැබී නොමැතිවීම නිසා එකී ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකි විය.

### 1.2.5 නීති,රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) පටහැනිව 1999 වර්ෂයේ සිට 2011 වර්ෂය අවසානය දක්වා කාල පරාසය තුල ගෙවන ලද රු.14,654,793 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම 2012 දෙසැම්බර් 31 දිනවන විටත් පියවා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සදහා අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.24,710,364 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.26,406,383 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,696,019 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන ආධාර ලැබීම රු.1,355,000 කින් වැඩිවීම සහ මෙහෙයුම් වියදම් රු.1,745,548 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 2.2 අධිකාරියට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතනයක් විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම පැහැර හැරීම නිසා රුපියල් මිලියන 158 ක වන්දි ඉල්ලා අධිකාරියට හා වෙනත් රාජ්‍ය ආයතන 2 කට එරෙහිව කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජූලි 10 දිනැති අංක 2/2012 දරන දිවිනැගුම චක්‍රලේඛය පරිදි නව ව්‍යාපෘති ආරම්භ කළ යුතු වුවත් 2012 වසර තුළදී කිසිදු නව ව්‍යාපෘතියක් ගාල්ල, මාතර සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල ආරම්භ කර නොතිබුණු අතර 2011 වර්ෂයේදී අවිච්ඡින්න කරන ලද ව්‍යාපෘති වලින් කොටසක් පමණක් නිමකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) අවිච්ඡේද වැඩසටහන තුල ක්‍රියාත්මක වන ව්‍යාපෘති ලෙස සඳහන්ව තිබූ රු.7,897,245 ක් වටිනා ව්‍යාපෘති 69 ක් 2012 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

(ඇ) අවිච්ඡේද වැඩවල උපචිත වියදම රු.39,150,079 ක් ලෙස ඇස්තමේන්තු සකස් කර තිබුණද එම ඇස්තමේන්තුව රු.16,426,281 ක් ලෙසට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2012 මාර්තු 14 දිනැති ලිපියෙන් සංශෝධනය කර තිබුණි. ඒ අනුව උපචිත වියදම රු.22,723,798 ක් වූ අවිච්ඡේද වැඩ නිම කරන ආකාරය පැහැදිලි නොවීය.

(ඈ) 2012 වර්ෂයේදී අධිකාරියේ කාර්ය මණ්ඩලයේ කාර්යයන් වී තිබුණේ 2011 වර්ෂයේදී නිම කරන ලද කාර්යයන් සඳහා ගෙවීම් කිරීම පමණක් වුවද සමස්ථ කාර්ය මණ්ඩලයම සේවයේ යොදවා ගෙන වැටුප්, ගමන් වියදම්, අතිකාල හා ඉන්ධන වෙනුවෙන් රු.108,785,898 ක වියදමක් 2012 වර්ෂයේදී දරා තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

#### 3.2.1 විදේශගත වූ නිලධාරිණියකට වැටුප් ගෙවීම

1998 අප්‍රේල් 01 දින සිට අධිකාරියේ ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස සේවය කල නිලධාරිණියකට 2005 පෙබරවාරි 28 දින සිට 2006 ජූලි 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා තම පෞද්ගලික වියදමින් ව්‍යාපාරවේදී පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා විදේශ ගත වීමට වැටුප් සහිත නිවාඩු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර 2005 මාර්තු 01 දින අධිකාරිය එම නිලධාරිණිය සමග ගිවිසුමකට එළඹ තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 14.1.1 සිට 14.1.5 දක්වා වූ වගන්තිවලට පටහැනිව 2005 පෙබරවාරි 28 දින සිට 2006 ජූලි 31 දින දක්වා කාලච්ඡේදය සඳහා එම නිලධාරිණියට විදේශගත වීම සඳහා වැටුප් සහිත නිවාඩු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි.

(ආ) නිලධාරිණියට සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලබා දීමේදී භාණ්ඩාගාර ලේකම්ගේ 2003 අගෝස්තු 25 දිනැති අංක MF/6/1/2/03 දරන චක්‍රලේඛයේ 4 ජේදය පරිදි පූර්ව අනුමැතිය ලබාගැනීම සිදුව නොතිබූ අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 1997 නොවැම්බර් 28 දිනැති අංක 24/97 දරන චක්‍රලේඛය පරිදි ගිවිසුම කඩකළහොත් නිලධාරිණියට එරෙහිව ගතයුතු ක්‍රියාමාර්ගද ගිවිසුමේ සඳහන්ව නොතිබුණි.

(ඇ) නිලධාරිණිය වෙත ලබාදී තිබූ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු කාලය 2006 ජූලි 31 දින අවසන් වුවද එකී දිනය 2007 ජූලි 31 ලෙසට සාවද්‍ය ලෙස වෙනස් කොට රු.270,934 ක් වැටුප් වශයෙන් ලබාගෙන තිබුණි. සභාපතිවරයා විසින් 2007 ජූලි 26, 2008 ජූලි 22 හා 2009 මාර්තු 19 දිනැති ලිපි මගින් 2007 අගෝස්තු 01 දින සිට 2009 ජූලි 31 දින දක්වා වූ කාලයට වැටුප් රහිත නිවාඩු අනුමත කර තිබුණි. 2007 සැප්තැම්බර් 21 දිනැති අංක 21/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 10 වන වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ විදේශගත කාලය දීර්ඝ කිරීමට ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා හේතු ඉදිරිපත් කළයුතු වුවද එවැනි කිසිදු හේතුවක් නොමැතිව එම නිලධාරිණියගේ විදේශගත නිවාඩු කාලය දීර්ඝ කර තිබුණි.

(ඈ) නිලධාරිණියගෙන් 2013 ජූලි 02 දින වන විට රු.1,002,928 ක මුදලක් අධිකාරියට අයවීමට තිබූ අතර කුඩා ලේඛන සකස් කර මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් 1982 අංක 12 දරන පොදු දේපල විෂයෙහිලා කරනු ලබන වැරදි පිළිබඳ පනත යටතේ මෙම මුදල් අයකර ගැනීමට කටයුතු නොකර ගිවිසුම් කඩකිරීමක් සිදුව ඇති ලෙස සලකා මාතර පොලිස් ස්ථානයේ 2012 ඔක්තෝබර් 23 දිනැති අංක (4)32/33 යටතේ පැමිණිල්ලක් කර තිබුණි.

3.2.2 **අධිකාරිය ඉඩම් පවරා ගැනීම හා බදුදීම**

(අ) අධිකාරිය විසින් අත්පත් කරගෙන තිබුණු ඉඩම් පිළිබඳව කරන ලද නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධිකාරියේ හිටපු සභාපති විසින් 1997 අගෝස්තු 08 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරු අමතන ලද ලිපිවලින් ඉඩම් පවරා ගැනීමෙන් අපේක්ෂා කරනුයේ පුද්ගලික අංශයේ සහයෝගය ඇතිව ඒකාබද්ධ ව්‍යාපාති ඇරඹීමට බව සඳහන් කර තිබුණද, 1998 වර්ෂයේදී අධිකාරිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමෙන් අධිකාරියට පවරා ගෙන තිබුණු ඉඩම් 08 ක් හා ගොඩනැගිලි 06 ක් පුද්ගලික අංශයට බදුදීම පමණක් සිදුකර තිබුණි.

(ii) ඉඩම් අත්පත් කර ගැනීම දැනුම දීම හා ගැසට් පත්‍ර මගින් නිවේදනය කර ඉඩම් පවරා ගැනීමේ කටයුතු නිමවන තෙක් සුදුසු ලේඛණ හා ලිපිගොනු පවත්වා නොතිබීම හේතුවෙන් අත්පත් කරගත් ඉඩම්වල වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු අනාවරණය නොවුණි.

(ආ) අධිකාරිය විසින් පෞද්ගලික ආයතනයක් සමඟ 2001 සැප්තැම්බර් 05 දින අත්සන් කර තිබුණු බදු ගිවිසුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධිකාරිය එම දේපල බදු දීමේදී බදුකරුගේ ඉල්ලීම මත අධිකාරියට අවාසි වන ලෙසට බදු ගිවිසුම අත්සන් කර තිබුණි. බදුකරුට බදු දේපල ඇපයට තබා ණය ලබා ගැනීමට ඉඩදී තිබුණු අතර, ණය ආපසු නොගෙවීමෙන් ඇතිවන අවධානම පිළිබඳව සලකා බලා නොතිබුණි. තවද අධිකාරිය වන්දි ගෙවා අත්පත් කරගත් දේපලද වර්ෂ 02 කදී බදුකරුටම අයිති වන ආකාරයට ගිවිසුම පිළියෙල කර තිබුණි.

(ii) බදු ගිවිසුමේ 7 වන කොන්දේසිය අනුව බදුකරු විසින් සවිකරනු ලබන රු.5,000 කට වැඩි වටිනාකම් සහිත යන්ත්‍ර සූත්‍ර, උපකරණ පිළිබඳ සවි කිරීමෙන් දින 30 ක් ඇතුළත අධිකාරියට දැන්විය යුතු වුවත් සවිකර තිබූ රු.101,776,557 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර, උපකරණ පිළිබඳ අධිකාරිය දැනුවත් කර නොතිබුණි. එසේම බදු ගිවිසුමේ 5 වන කොන්දේසියට පටහැනිව අධිකාරියේ ලිඛිත අවසරයකින් තොරව රු.55,486,250 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබූ බව 2013 මාර්තු 25 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

### 3.2.3 දිවිනැගුම ව්‍යාපෘති ඉටුකිරීමේ දුර්වලතා

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් 2012 වසරේදී දිවිනැගුම ව්‍යාපෘති යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල යන දිස්ත්‍රික් 04 හි ගව, එළු, කුකුල් පැටවුන් ලබාදීම හා ගව අභිජනන මධ්‍යස්ථාන පිහිටුවීම වෙනුවෙන් රු.5,238,702 ක වියදමක් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාතර දිස්ත්‍රික්කයේ කුකුල් පැටවුන් බෙදාදීම, කුකුල් අභිජනන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා රු.987,611 ක මුදලක් වැයකර තිබූ අතර තිහගොඩ ප්‍රදේශයේ ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත කුකුල් පැටවුන් 300 ඇති කිරීමට ලබාදී තිබුණත් 2013 මාර්තු 07 දිනැති භෞතික පරීක්ෂාවේදී එකී ප්‍රතිලාභීන් දෙදෙනාම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි.

(ආ) ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 08 දෙනෙකු වෙත ලබාදී තිබූ කුකුල් පැටවුන් 80 කින් 60 ක්ද, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 13 දෙනෙකු වෙත ලබාදී තිබූ කුකුල් පැටවුන් 130 කින් 81 ක්ද මියගොස් තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

#### 3.3.1 අක්මීමන බෝගහගොඩ පොළ භූමිය සකස් කිරීම හා අලෙවි සැල සහිත අවන්හල ඉදිකිරීම

අධිකාරිය විසින් ඉහත ඉදිකිරීම සඳහා එකතුව රු.4,619,475 ක් වූ ඇස්තමේන්තු 04 ක් සකස් කර 2010 දෙසැම්බර් හා 2011 අගෝස්තු මාසවල කොන්ත්‍රාත්කාර සමිති 04 ක් සමඟ ගිවිසුම් අත්සන් කර 2010 හා 2011 වර්ෂවලදී රු.4,111,068 ක මුදලක් ගෙවා තිබුණි. සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේ සංවර්ධන සැලැස්ම මගින් ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර 2010 නොවැම්බර් 11 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි 2010 වර්ෂයේ නොගෙවා ඉතිරිව තිබූ රැඳවුම් මුදල් යොදා ගෙන තිබුණද එම වර්ෂයේම වැඩ නිමකර නොතිබුණි. තවද 2011 වර්ෂයට අවිච්ඡේද නොකළ මෙම ව්‍යාපෘති සඳහා අවිච්ඡේද කළ සැලැස්මේ සඳහන් ව්‍යාපෘති දෙකක කටයුතු නවතා රු.439,603 ක් මෙම ව්‍යාපෘති වලට යොදවා ගෙන තිබුණි.

(ආ) 2011 ඔක්තෝබර් 10 දින අක්මීමන ප්‍රාදේශීය සභාව වෙත අවබෝධතා ගිවිසුමකින් තොරව වැඩ නිමකළ උක්ත ව්‍යාපෘතිය භාරදී තිබුණ අතර 2013 මාර්තු 21 දින භෞතික පරීක්ෂණ අවස්ථාව වන විටත් එම ව්‍යාපෘතිය අපේක්ෂිත මහජන යහපතෙහි යොදවා නොතිබුණි. මේ නිසා අධිකාරිය නිසි සැලසුමකින් තොරව වැය කළ රු.4,111,068 ක වියදම ඵලරහිත වී තිබුණි.

(ඇ) අක්මීමන ප්‍රාදේශීය සභාව සතු මෙම ඉඩමේ, අධිකාරිය විසින් 2010 දෙසැම්බර් මාසයේ වැඩ ආරම්භ කිරීමට ප්‍රථම එනම් 2010 අප්‍රේල් 20 දින ප්‍රාදේශීය සභාව විසින්ද පස් කැපීමට හා අත්තිවාරම් ඉදිකිරීම වෙනුවෙන් රු.1,583,754 ක් වැය කර තිබුණි. ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා නොගැනීම ඊට හේතුවී තිබුණි.

#### 3.3.2 කටපොද්දුව කෘෂිවේල්ල සංවර්ධනය

2011 වසරේ දිවිනැගුම වැඩ සටහන යටතේ පාලටුව, කටපොද්දුව කෘෂිවේල්ල සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් අධිකාරිය 2011 පෙබරවාරි 11 දින සමෘද්ධි සමිතියක් සමඟ රු.299,710 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර රු.293,710 ක මුදලක් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය පිළිබඳව වූ ශාක්‍යතා වාර්තාව අනුව වගා කිරීමට ඉලක්ක කල කුඹුරු අක්කර 40 ක ප්‍රමාණය වගා කර නොතිබුණු බව 2013 මාර්තු 06 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

#### 3.3.3 කඩවරයාය ඇලෙහි දකුණු ඉවුර පස්වේල්ල තැනීම හා කොටවිල දකුණ ගිංගස්විල ඇලෙහි වම් ඉවුර වේල්ල ඉදිකිරීම

කුඹුරුවල එකතු වන ජලය පිටකිරීම මූලික අරමුණ ඇතිව අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලය යටතේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යථෝක්ත ඉදිකිරීම සඳහා 2011 දෙසැම්බර් මාසයේදී පිළිවෙලින් රු.252,200 ක් හා රු.491,941 ක වටිනා ගිවිසුම් 02 ක් අත්සන් කර රු.672,080 ක මුදලක් ගෙවා තිබුණි.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘති දෙක සඳහා ඇස්තමේන්තු දෙකක් සකස් කර ගිවිසුම් දෙකක් අත්සන් කර තිබුණත් සංවර්ධනය කර තිබුණේ එකම වාරිමාර්ග ඇලක දකුණු ඉවුරෙහි කොටසක් පමණක් බව 2013 මාර්තු 07 දිනැති භෞතික පරීක්ෂණයේදී තහවුරු වූ අතර වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරියා විසින්ද ඒ බව තහවුරු කර තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘති දෙකට අදාල ශාක්‍යතා වාර්තාව අනුව අවුරුදු 25 ක් පුරන්ව පැවති අක්කර 90 ක භූමි ප්‍රමාණයක් වගා කිරීමට ඉලක්ක කර තිබුණි. ව්‍යාපෘතියේ අරමුණ වූයේ කුඹුරු වල එක්රැස් වන ජලය බැසයාමට ඇල මාර්ගය සකස් කිරීම වුවද, වම් ඉවුර පස් දමා සංවර්ධනය නොකිරීමත්, දකුණු ඉවුරේ මීටර් 180 ක කොටසක් සංවර්ධනය නොකිරීමත් නිසා ජලය බැස නොයාම හේතුවෙන් ඉහත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී තිබූ හෙයින් අධිකාරිය වැය කල රු.672,080 ක වියදම ඵලරහිත වී තිබුණි.

### 3.3.4 ව්‍යාපෘති අතහැර දැමීම

අධිකාරිය විසින් 2011 වර්ෂය තුළදී සමිති 04 ක් සමග අත්සන් කර තිබුණු මාර්ග 04 ක් ඉදිකිරීම් සම්බන්ධ රු.2,032,898 ක් වටිනා ගිවිසුම්වල සඳහන් වැඩ ඉටු නොකර ඒවා සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

### 3.3.5 තම්මැන්නාවැව ප්‍රතිසංස්කරණය කිරීම

හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය විසින් 2010 වර්ෂයේ "ජාතික සවිය" ගම නැගුම වැඩ සටහන යටතේ රු.8,687,630 ක් වටිනා ඇස්තමේන්තු 05 ක් පිළියෙල කර තිබුණි. එය අදියර 05 ක් යටතේ ලියාපදිංචි සමිති 05 ක් සමඟ එකතුව රු.8,517,392 ක් වූ ගිවිසුම් 2010 ඔක්තෝබර් 21 දින අත්සන් කර තිබුණි. 2010 දෙසැම්බර් 03 දින සිට 2011 මාර්තු 01 දින දක්වා වූ කාල පරාසය තුල රු.5,896,390 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළමු, දෙවන හා තෙවන අදියරයන්හි ඇස්තමේන්තු සකස් කිරීමේදී එකම වැව් බැම්ම සඳහා සමාන අයිතමයන්ගෙන් හා සමාන ප්‍රමාණයන්ගෙන් යුක්තවූ, ඇස්තමේන්තුව කොටස් තුනක් වශයෙන් සැලකිල්ලට ගැනීමට අධිකාරියේ ඉංජිනේරු වරයා අනුමැතියදී තිබූ අතර පළමු අදියරේ ඇස්තමේන්තුව හා ප්‍රමාණ පත්‍රවල ජායා පිටපත් දෙවන හා තෙවන අදියරයන් සඳහා යොදාගෙන තිබුණි.

(ආ) 2008 අප්‍රේල් 29 දිනැති චක්‍රලේඛ/ගමනැගුම/03/2008 අංක දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 05 ඡේදය පරිදි ප්‍රමාණ පත්‍ර (BOQ) ක්‍රමයට ඇස්තමේන්තු සකස් කර නොතිබූ අතර, කර්මාන්තයේ එක් එක් අයිතමය කොටස් කර කොන්ත්‍රාත්කාර සමිති වලට පැවරීමේ පරමාර්ථයෙන් ඇස්තමේන්තු සකස් කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ පළමු, දෙවන හා හතරවන අදියරයන්හි ගිවිසුම් අත්සන් කළ කොන්ත්‍රාත්කාර සමිති නිලධාරීන්ගේ 2013 අප්‍රේල් 19 දිනැති ප්‍රකාශ අනුව ගිවිසුම් අත්සන් කළද වැඩ ඉටුකරන ලද්දේ තමන් නොවන හෙයින් ඒ ඒ වැඩ ඉටුකළ ස්ථාන තමන්ට පෙන්විය නොහැකි බව පිළිගෙන තිබුණි. 2013 අප්‍රේල් 02 දිනැති කාර්මික නිලධාරියාගේ ප්‍රකාශයෙන්ද ඒ ඒ සමිති වැඩ ඉටු කල ස්ථාන හා මිණුම් පෙන්විය නොහැකි බව පිළිගෙන තිබුණු අතර මිණුම් ලබාගත් ක්ෂේත්‍ර පොතද ඉදිරිපත් කල නොහැකි බව පිළිගෙන තිබුණි. මේ නිසා ගෙවීම් කිරීම සඳහා ලබාගත් මිණුම් නිවැරදි බවට තහවුරු කරගත නොහැකි විය.

(ඈ) ව්‍යාපෘතියට අයත් වැව් බැම්මේ දිග මීටර් 420 ක් බව 2013 අප්‍රේල් 02 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඇස්තමේන්තුගත දිග මීටර් 520, මීටර් 518 හා මීටර් 1560 ලෙසට ගණනය කර අදියර 5 සඳහා ගෙවීම් කිරීම නිසා රු.806,042 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) වැව් බැම්ම සඳහා සපයා තිබූ පස් ඝන මීටර් 4336 ක් වෙනුවෙන් රු.2,065,706 ක් ගෙවා තිබුණද එකී පස් නියමිත ප්‍රමිතියෙන් යුක්ත ඒවාද යන්න පිළිබඳව පරීක්ෂණාගාර සහතිකයක් නොතිබුණි. වැව් බැම්මේ ආරක්ෂාව සඳහා Pitching of Dam Embankment අයිතම යටතේ යෙදිය යුතුව තිබූ අඟල් 6x9 ප්‍රමාණයේ කළුගල් වෙනුවට අඩි 1½ ප්‍රමාණයේ නියමිත ප්‍රමිතියෙන් තොරවූ කළුගල් යොදා ඒ සඳහා රු.2,394,503 ක් ගෙවා තිබුණි.

(ඊ) වැව් බැම්ම හා පිටවාන ස්ථාන 4 කින් පිපිරීම නිසා ජලය කාන්දු වෙමින් පැවතුණි. මෙම ව්‍යාපෘතිය යටතේ අක්කර 610 ක් අළුතින් වගා කිරීමටත්, ලුණුගම්වෙහෙර ජලාශයේ සිට ඇල මාර්ගයක් කපා තවත් වැව් 5 ක් පෝෂණය කිරීමටත් ඉලක්ක කළද එම අරමුණ ඉටු කර නොතිබුණි. මේ නිසා අධිකාරිය වැය කළ රු.5,896,390 කට අදාල නිසි ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| තනතුරු වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක | 05 | 04 | 01 | - |
| ද්විතියික | 97 | 96 | 01 | - |
| තෘතියික | 105 | 95 | 10 | - |
| ප්‍රාථමික | 80 | 82 | - | 02 |
| | 287 | 277 | 12 | 02 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගාල්ල දිස්ත්‍රික් අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 03 සඳහා රියදුරන් තිදෙනෙකු හා රිය සහායකයෙකු පමණක් අවශ්‍ය වුවද එකී ප්‍රමාණයට වඩා රියදුරන් 09 දෙනෙකු හා රිය සහායකයින් දෙදෙනෙක් විය.

(ආ) රියදුරන් හා රිය සහායකයින් වර්ෂය තුල සේවයේ යෙදී ඇති සම්පූර්ණ දින ගණන 304 ක් (රිය සහායකයන් දෙදෙනෙකු දින 98 ක් වෙනත් රාජකාරියේ යෙදී ඇත.) පමණක් වූ අතර රියදුරු/රිය සහායකයින් තිදෙනෙකු එක දිනක් හෝ සේවයේ යෙදී නොතිබුණු අතර එක් අයෙකු දින 2 ක් පමණක් සේවයේ යෙදී තිබුණි.

## 3.5 සේවක පාරතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනට පාරතෝෂික දීමනා ගෙවීම් සඳහා ප්‍රතිපාදිත මුදල රු.40,939,560 ක් වුවද, පාරතෝෂික ගෙවීම් සඳහා වන අනාගත බැරකම් පියවීමට වෙනම අරමුදලක් ගොඩනැංවීම සඳහා පවත්වා තිබුණු බැංකු ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.993,740 ක් වී තිබුණි.

## 3.6 වාහන උපයෝජනය

සමාලොචිත වර්ෂයේදී මෝටර් රථ 12 ක්, වෑන් රථ 02 ක් , කැබ් රථ 19 ක්, බවුසර් රථ 04 ක් සහ ලොරි රථ 07 ක් අධිකාරිය සතුව තිබුණි. වර්ෂය තුල පෙට්‍රල් හා ඩීසල් වාහන සඳහා මුළු ධාවන පිරිවැය පිළිවෙලින් රු.1,071,613 ක් හා රු.20,385,189 ක් වූ අතර කි.මි. 1 ක් සඳහා සමස්ථ සාමාන්‍ය වියදම පිළිවෙලින් රු.31.64 ක් සහ රු.60.52 ක් වී තිබුණි. ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ පැවති වාහන 3 සමාලෝචිත වර්ෂයේදී ධාවනයේ යොදවා තිබුණු මුළු දුර කි.මි. 9451 ක් වන අතර කාර්යාලයට අනුයුක්ත රියදුරන් 12 දෙනෙක් හා රිය සහායකයින් තිදෙනෙක් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.2,853,416 ක් ගෙවා තිබුණි. වාහන නඩත්තු හා ඉන්ධන වෙනුවෙන් රු.122,385 ක්ද වැයකර තිබුණි. ඒ අනුව වියදම් කළ මුදල හා ධාවනය කර තිබුණු කිලෝ මීටර් ගණන සමස්ථ වියදම සලකා බැලීමේදී එක් කිලෝ මීටරයක් ධාවනය කිරීම සඳහා රු. 315 ක් වැය කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

2012 සිට 2015 දක්වාවූ කාල පරිච්ඡේදය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම වැඩ සටහනට අනුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබුණද, 2011 වර්ෂයට අදාල අවිච්ඡේද ව්‍යාපෘතිවලට මුදල් ගෙවීම පමණක් 2012 වර්ෂයේදී සිදුකර තිබුණි. ඒ අනුව අධිකාරියේ ප්‍රධාන අරමුණුවලට ඇතුලත් කාර්යයන් වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 ක්‍රියාකාර සැලැස්ම

2012 වර්ෂය සඳහා කයාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණද එම සැලැස්මේ ඇතුළත් නව ව්‍යාපෘති අමාත්‍යාංශයෙන් මුදල් නොලැබීම නිසා ක්‍රියාත්මක කර නොතිබුණ අතර 2011 වසරේ අවිච්ඡේද ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය විසින් අනුමත අභ්‍යන්තර විගණන වැඩ සටහන සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය මෙහෙයවා නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.4 **ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණත් එකී සැලැස්ම පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණි.

4.5 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණත්, සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකාර සැලැස්මට අනුව කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් අයවැය සඵල පාලන කාරකයක් ලෙස ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) අයවැය පාලනය
(ආ) වත්කම් පාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය